ආරම්භය 1945-09-30 ලි.ප. අංකය:39/82
දෙහිවල,සුදර්ශන පාරේ,ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි
දෙහිවල බෞද්ධෝදය සංගමය මගින්, ධර්මදානය පිණිස සෑම පුර පසළොස්වක පොහොය දිනයක් පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය

79 වර්ෂය - ශ්‍රී බු: ව 2568 2025 ජූනි 10 පොසොන් කළාපය

**දෙහිවල ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනාධිපති**
**ඓතිහාසික සිතුල්පව්ව රාජමහා විහාරාධිකාරී,**
**කොළඹ නාලන්ද මහානාම විද්‍යාලවල හිටපු ධර්මාචාර්ය,**
**ශාස්ත්‍රපති, පණ්ඩිත, පූජ්‍ය, ලේල්වල සමිත ස්වාමීන්වහන්සේ**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

# "පොසොන් උදාවයි දහම් අමාවයි"

**"යම්හි සච්චං ච ධම්මෝ ච - අහිංසා සඤ්ඤමෝ දමෝ**
**සවේ වන්තමලෝ ධීරෝ - ථෙරෝ ඉති පවුච්චති"**

**(ධම්ම පදය, ධම්මට්ඨ වර්ගය, 6 වන ගාථාව)**

සුපින්වතුනි,

යම් අයකු තුළ සත්‍යයත්, ධර්මයත්, අහිංසක බවත්, සංවර කමත්, ඉන්ද්‍රිය දමනයත් තියෙනවා නම් ඔහු කෙලෙස් නමැති කිළුටු වමාරා දැමූ ඥානවන්තයෙකි. ස්ථවිර කියා කිව යුත්තේ ඔහුටයි.

බුදුරජාණන් වහන්සේ මේ ගාථාව වදාළේ සැවැත්නුවර ජේතවනාරාමයේදී අසූ මහා ශ්‍රාවකයන්ගේ එක් නමක වූ ලකුණ්ටක භද්දිය නම් මහ රහතන් වහන්සේ අරභයාය. භද්දිය තෙරුන් වහන්සේ මිහිරි හඬ (මධුරස්වර) ඇති භික්ෂූන් අතර අග තනතුර ලැබුවා.මේ හාමුදුරුවෝ පෙර පියුමතුරා (පදුමුත්තර) බුදුරජාණන් වහන්සේ කාලයේ එක්තරා ධනවත් කුලගෙයක ඉපිද සිටියා. දිනක් මොහු බණ ඇසීමට පන්සලට ගිය විට පියුමතුරා බුදුරජාණන් වහන්සේ එක්තරා භික්ෂුවක් මිහිරි හඬ ඇති භික්ෂූන් අතර අග තනතුරෙහි

තබනවා දැක මමත් අනාගත බුදුවරයකුගේ ශාසනයෙහි මිහිරි කටහඬ ඇති භික්ෂූන් අතර අග තනතුර ලබම්යි ප්‍රාර්ථනාවක් ඇති කර ගත්තා. ධර්ම දේශනාව අවසානයේ බුදුරදුන් වෙතට ගිය මේ උපාසකයා බුදුරජාණන් වහන්සේට භික්ෂු සංඝයා සමග හෙට දින සිට දින හතක් තමන්ගේ නිවසෙහි දානය සඳහා වැඩම කරන ලෙස අරාධනා කළා.

ඊලඟ දවසේ සිට දින හතක් තමාගේ නිවසෙහි බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නයට ප්‍රණීත ආහාර පානයෙන් සංග්‍රහ කළා. සත්වැනි දවසේ දන් වළඳා අවසන් වූ පසු බුදුරජාණන් වහන්සේ භුක්තානුමෝදනා ධර්ම දේශනාව කළා. ඉන්පසු මොහු බුදුරදුන් වෙත ගොස් මේ දානානිසංසයෙන් අනාගත බුදුවරයකුගේ ශාසනයෙහි මිහිරි හඬ ඇති භික්ෂූන් අතර අග්‍රස්ථානය ලබම්වායි ප්‍රාර්ථනා කළා.

එවිට පියුමතුරා බුදුරජාණන් වහන්සේ මොහුගේ ප්‍රාර්ථනාව කවදා ඉටුවේදැයි දිවැසින් බැලුවා. අනාගතේ පහළවන ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලය වන විට මොහුගේ ශ්‍රද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා යන පංච ඉන්ද්‍රිය ධර්මයන් සම්පූර්ණ වන බව දැක මෙසේ වදාළා.

“උපාසකය, තොපගේ ප්‍රාර්ථනය මෙයින් කල්ප ලක්ෂයක් ගිය තැන පහළවන ගෞතම බුදුරජාණන් වහන්සේගේ සසුනෙහි ඉෂ්ට වන්නේය. ‘යනුවෙන් විවරණ දුන්නා. ඉන් පසු තව තවත් දාන සීලාදී කුසල් දහම් සිදු කළ මෙතෙම දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා විපස්සී සම්බුදු රදුන්ගේ කාලයෙහි චිත්‍ර පත්‍ර නම් කොවුලකු වී උපන්නා.

එක දිනක ඌ තමා වසන ඛේම නමැති වනයෙන් පිටත්ව හිමාලය වනයට පියඹා ගොස් රස පලතුරු අනුභව කොට තම දරුවන්ට දීමට තවත් මී අඹ ගෙඩියක් හොටයෙන් අරගෙන එන විට විපස්සී බුදුහාමුදුරුවෝ භික්ෂු සංඝයා පිරිවරාගෙන පාරේ වඩිනවා දැක උන්වහන්සේ අසලින් එහාට මෙහාට පියැඹුවා. බුදුහාමුදුරුවෝ උපස්ථායක භික්ෂුව කාරණය වටහාගෙන බුදුහාමුදුරුවන්ගේ පාත්‍රය උන්වහන්සේගේ අතට දුන්නා. කොවුලා පියාඹාගෙන ඇවිත් ඒ මී අඹ ගෙඩිය බුදුහාමුදුරුවන්ගේ පාත්‍රයට දාලා නැවතත් එහාට මෙහාට පියාඹමින් සිටියා. බුදුහාමුදුරුවෝ උගේ සිත දැනගෙන ගසක් මුල වැඩහිඳ ඒ අඹ ගෙඩිය වැළඳුවා. සාධුකාර දෙන්නාක් මෙන් මිහිරි හඬින් නාද කරමින් බුදුරජාණන් වහන්සේගේ පසුපසින්ම පියැඹුවා. එදා ඒ සිදු කළ පින නිසා උපනුපන් භවයේ කටහඬ මිහිරි වුණා.

ඉන් පසු දෙව් මිනිස් දෙගතියෙහි සැරිසරා කාශ්‍යප බුදුරදුන්ගේ කාලයේ වඩු කාර්මික (ගෙවල් තනන) පවුලක උපන්නා. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ පසු ඒ නුවර වැසියන් උන්වහන්සේගේ ධාතු නිදන් කොට ස්තූපයක් කර වීමට සාකච්ඡා කළා.

ඔවුන්ගේ අදහස වුණේ විශාල ස්තූපයක් සෑදවිය යුතු බවයි. ස්තූපය හැදීමේ කටයුත්ත භාරව සිටි වඩු කාර්මිකයන්ගේ ප්‍රධානියා වුණේ මේ කියන පුද්ගලයා. මිනිසුන් ඉතා විශාල ප්‍රදේශයක් ආවරණය වනසේ ස්තූපය හදන්න කථා කළත් ස්තූපයේ ප්‍රමාණය ගැන තීරණයකට එන්න බැරි වුණා. එවිට මේ වඩු නායකයා ඒ මිනිසුන්ට කථා කොට " ඔයතරම් ලොකු ස්තූපයක් හැදුවොත් ඒක නඩත්තු කරන්න අපහසුයි. අවුරුදු පතා සුණු පිරියම් කරන්න ලොකු මුදලක් යනවා. ඒ නිසා යොදුනක් පමණ බිම වට කොට යොදුනක් උසට ස්තූපය හදමු'' යි යෝජනා කළා. මිනිස්සු ඒ අදහසට කැමති වෙලා අනුමැතිය දුන්නා. අප්‍රමාණ වූ බුදුරජාණන් වහන්සේට අඩු ප්‍රමාණයක් නියම කළ නිසා උපනුපන් භවයෙහි අන් යට වඩා මිටි පුද්ගලයකු වුණා.

අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ කාලයේ සැවැත්නුවර ධනවත් පවුලක උපන් හෙතෙම බුදුරදුන් වෙත ගොස් බණ අසා පැහැදී පැවිදි වුණා. ඔහුට දෙමාපියන් තැබූ භද්දිය යන නමට මුලින් ලකුණ්ටක (මිටි) යනුවෙන් කොටසක් එකතු කරලා උන්වහන්සේට හැමෝම ඇමතුවේ ලකුණ්ටක භද්දිය කියලා. බුදුහාමුදුරුවන්ගේ කමටහන් ලබාගෙන භාවනා කරමින් සිටින අතරේ සැරියුත් හාමුදුරුවන්ගේ ධර්ම දේශනාවක් අසා රහත් වුණා.

උන්වහන්සේ රහත් වී සිටියත් ඒ බව නොදත් අනෙක් භික්ෂූන් මිටි හා දුර්වර්ණ ශරීරය නිසා නොයෙක් විසුළු නම් කියමින් උන්වහන්සේට කවටකම් කළා. ඔය අතරේ දුර පළාතක සිට භික්ෂූන් තිස් නමක් ජේතවනාරාමයට ආවා ඒ අයත් ලකුණ්ටක භද්දිය හාමුදුරුවන් දැකලා ආ.. පොඩි නම, අම්ම තාත්තා බලන්න යනවද? ආදී වශයෙන් විහිලු කළා. ඒ දුටු බුදුහාමුදුරුවෝ " මහණෙනි ඔතැනින් ගියේ සාමණේර නමක් නොවෙයි. උපසම්පදා වූ භික්ෂුවක් ඒ වගේම රහත් වූ කෙනෙක්. ඕනෑම වෙලාවකට ඕනෑම සමාපත්තියකට, ඕනෑම ධ්‍යානයකට, සමවදින්න හැකියාව තියෙන කෙනෙක්. බොහොම ඥානවන්ත කෙනෙක්. අංගසම්පූර්ණ මුනිවරයෙක්. යැයි පවසමින් මේ ගාථාව දේශනා කළා. මේ කුඩා භික්ෂුව කොතරම් ලොකු කෙනෙක් දැයි භික්ෂූන්ට වැටහුණේ එවිටයි.

කිසිම හිංසාවක් කරන්නේ නැතිව මෛත්‍රියෙන් හා කරුණාවෙන් යුක්තව සිටිනවා නම් (අහිංසා), කය හා වචන දෙක මගින් සිදුවන අකුසල්වලින් වෙන්වී සන්සුන් කම ඇති කරගෙන සිටිනවා නම් (සඤ්ඤමෝ) (සිල්වත් බව මෙයින් අදහස් කෙරේ), ඇස, කන, නාසය, දිව, ශරීරය යන මේ පංච ඉන්ද්‍රියන්ට රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන අරමුණු ලැබෙන විට ඒවා කෙරෙහි රාගයෙන් ඇලීම, ද්වේශයෙන් ගැටීම සිදු නොකර ඒ අභ්‍යන්තර ආයතනවලත් බාහිර ආයතනවලත් හේතු ප්‍රත්‍ය ධර්මතාව නිසා අනිත්‍ය වන හැටි, අනිත්‍ය දේ ගැන තණ්හාව ඇති කරගත්විට දුක හට ගන්නා හැටි, අනිත්‍ය වූ දුක් සහගත කිසිවක් මම, මගේ කියල ආත්ම වශයෙන් ගත නොහැකි බව සිහිකරනව නම් ඒ සඳහා කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා වශයෙන් සිහිය යොමු කරගෙන වාසය කරනවා නම් (=දමෝ), එසේ සිහිය පිහිටුවාගෙන භාවනා කරලා විදර්ශනා ඥානයෙන් සියලු කෙලෙස් නමැති අපවිත්‍ර දේ වමාරා දමා හෙවත් නැති කරල නම් (= වන්තමලෝ) ඔහුට "ස්ථවිර

යනුවෙන් පැවසිය හැකි බව බුදුරජාණන් වහන්සේ මේ ගාථා ධර්මයෙන් පෙන්වා දුන්නා.

ගිහියන් අතර වුවත් යමෙකු වයසට ගිය පමණින් සම්භාවනීය පුද්ගලයකු නොවන බවත්, ඔහු තුළ මිනිස් ගුණධර්ම පිහිටා තිබෙන පමණට ඔහුගේ උසස්බව, සම්භාවනීය බව ඇතිවන බවත් අප මෙයින් තේරුම් ගත යුතුයි. අද වගේ පොසොන් පොහොය දවසක මිහිඳුමාහිමියන් අපට ලබාදුන්නේ මෙබඳු උතුම් උපදෙස් සහිත වටිනා ධර්මයක්. ඒ නිසා අපි බෞද්ධයන් වශයෙන් ඒ මග යාමට අදිටන් කර ගනිමු.

සැමට තෙරුවන් සරණයි!